# සීගිරි කුරුටු ගීවලින් හෙළිවන සමකාලීන සමාජය පිළිබඳ අධ්‍යයනයක්

*කුලසේකර, ඩී. ජී. එන්.* [1]

සීගිරිය වූ කලි ඓතිහාසික, සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් රාශියකින් සුසංයෝජනය වූ අද්විතීය ගණයේ නිර්මාණයකි. සීගිරි පර්වතයේ බටහිර පෙදෙසේ  දක්නට ඇති කැටපත් පවුර නමින් හඳුන්වනු ලබන ව්‍යුහයක ලියා ඇති කුරුටු ගී ක්‍රි. ව. 7වන සියවස සිට 13වන සියවස දක්වා යුගයකට අයත් කළ හැකි අන්දමේ ඒවාය. මේවා රචනා කරන ලද්දේ සීගිරිය නැරඹීමට පැමිණි රසිකයින් විසිනි. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ සීගිරි කැටපත් පවුරේ ඇති සීගිරි කුරුටු ගීවලින් හෙළිවන සමකාලීන සමාජ තත්ත්වය පිළිබඳව අධ්‍යයනය කිරීම වන අතර,  අධ්‍යයනයේ ගැටලුව වන්නේ සීගිරි කුරුටු ගීවලින් සමකාලීන සමාජය පිළිබඳව තොරතුරු අනාවරණය වනු ඇතිද යන්නයි. මෙම අධ්‍යයනයේ පර්යේෂණ ක්‍රමවේදයේ  ප්‍රාථමික මූලාශ්‍රය ලෙස සීගිරි කුරුටු ගීද, ද්විතීයික මූලාශ්‍රය ලෙස පශ්චාත් කාලීන උගතුන්ගේ විචාර ග්‍රන්ථද යොදා ගනු ලැබිණි. මෙහි අන්තර්ගතය වන්නේ රසඥතාව උදෙසා සාමාන්‍ය ගැමියා විසින් කුරුටු ගී රචනා කරනු ලැබුවත් මෙම පද්‍ය තුළින් සමකාලීන සමාජය තුළ පැවති දේශපාලන, ආර්ථික, සමාජීය, ආගමික හා සංස්කෘතික පසුබිම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමයි. සීගිරි කුරුටු ගී පිළිබඳව මුල්ම අවධානය යොමුකරනු ලැබුවේ එච්. සී. පී. බෙල් මහතා විසින් වන අතර, ඉන්පසුව සීගිරි කුරුටු ගී කියවීමේත්, නිවැරදි අර්ථ නිරූපණය කිරීමේත්, ගෞරවය හිමිවන්නේ මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාණන්ටය. එතුමා විසින් සීගිරි කුරුටු ගී 685 කියවා **'සීගිරි ග්‍රැෆිටි'** රචනා කරන ලදි. මෙම සීගිරි කුරුටු ගී සමකාලීන සමාජ තොරතුරු විවරණය කිරීමේ අරමුණින් රචනා වී නැතත්, ඒවායින් දේශපාලන, ආර්ථික, සමාජ, සංස්කෘතික තොරතුරු අනාවරණය කර ගත හැකිය යන්න මෙම අධ්‍යයනයේ නිගමනයයි.

**ප්‍රමුඛ පදඃ** සීගිරිය, කැටපත් පවුර, කුරුටු ගී, සමකාලීන සමාජය

[1] *ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, ඉතිහාසය අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*nalinikulasekara@gmail.com*